# THE SIGNALLER

2

SRI LANKA SIGNAL CORPS JOURNAL

1ST HALF '99



Sch of Sig



Farewell parade to Col MA Wipulaguna accorded by 1 SLSC in Minneriya.



Seva Vanitha unit was officially formed by the Wives of Signal Officers under the patronage of Mrs. Nilanthi Seneviratne.



1st issue of the "SIGNALLER" Bi-Annual Magazine is presented to Brig WDN Premasiri by Col. KS Liyanage at Panagoda.

# දෙවන කලාපය


" The Signaller"
is the half yearly publication of the Sri Lanka Signal Corps.

" ද සිග්නලර්"
ශ්‍රී ලංකා සංඥා බලකායේ අර්ධ වාර්ෂික ප්‍රකාශනයයි.



## EDITORIAL BOARD

Lt Col TF Meedin RSP
(Chief Editor)

Lt Col C Weeratunga

Maj BHMA Wijesinghe

Maj NP Akurantilleke



Address :-
Editor,
Signal Regimental Centre,
Army Cantonment, Panagoda.
Tel :- 01-342818

Designed & Printed by
Market Information Systems (Pvt) Ltd.

Next Issue : December 1999


## CONTENTS


| | පිටුව |
|---|---|
| පනිවිඩ | 2 - 4 |
| සංඥ චිත්ති | 5 - 16 |
| සිප් සතර | 17 - 25 |
| ඉතිහාසයෙන් බිඳක් | 26 - 29 |
| පන්හිඳ | 30 - 38 |
| කෙළි බිම | 39 - 40 |


# කතු වැකිය



**"ද සිග්නලර්"** අර්ධ වාර්ෂික සඟරාවේ සංස්කාරක මණ්ඩලය භාරව කටයුතු කිරීමට අවස්ථාවක් ලැබීම ගැන ප්‍රථමයෙන් මම අවංකව සතුටු වෙමි. ප්‍රථම වරට මෙම සඟරාව 1998 වසරේ අවසාන භාගයේදී, නිකුත් කිරීම, බලකා ඉතිහාසයේ ඉතා විශේෂ අවස්ථාවක් විය. මෙම වසරේදී බලකාධිපතිගේ සංකල්පනාවක් අනුව නව මුහුණුවරකින් සංඥා පාඨක ලෝලීන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා වැඩි වශයෙන් සිංහල භාෂාවෙන් ලිපි හා අනෙකුත් අංගයන් හට ප්‍රමුඛත්වයක් දීමට කටයුතු කර ඇත.

තාක්ෂණය ඉතා වේගයෙන් දියුණුවන ලෝකයක, මෙම සඟරාව අනුග්‍රහයෙන් සංඥ බලකායේ සිටින සියළුම අයවළුන්ගේ දැනුම හා මානසික වර්ධනය ඉතා උසස් මට්ටමකට පවත්වනු ඇත යනු මා විශ්වාසයයි. ඔවුන්ගේ නිර්මානශීලී හැකියාවන් වඩාත් ඔපවත්ව ප්‍රතිරූපනය කිරීම සඳහා මෙය ඉතාමත් අනගි අවස්ථාවක් වනු ඇත.

සංඥ බලකායේ නිළධාරීන් හා සෙබලුන් විසින් නිර්මානය කර ඇති, ලිපි අදහස්, උදහස් සිතුවිලි, ගී සංකල්පනා සහ සදැස් නිසදැස්, නිර්මාන මෙවර කලාපයට ඇතුලත් කර ඇති අතර ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා බොහෝ ලිපි පල කිරීමට නොහැකි විය. නුදුරේදී එම ලිපි පලකිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලැබෙනු ඇත.

අවසාන වශයෙන් දෙවන කලාපය එළිදකින මෙම ශුභ හෝරාවේ පාඨක ඔබගෙන් ලැබෙන සහය සහ විග්‍රහය ඉතා අගය කොට සලකන අතර, එය සඟරාවේ ඉදිරි දියුණුවට ඉමහත් රුකුලක් වනු ඇත යනු මාගේ ස්ථිර විශ්වාසයයි.

**ප්‍රධාන සංස්කාරක.**

# බලකාධිපතිතුමාගේ පණිවුඩය



සංඥ රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් පලකරනු ලබන "ද සිග්නලර්" අර්ධ වාර්ෂික සඟරාවේ දෙවෙනි වෙළුමට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ඉතා භාග්‍යයක් කොට සලකමි.

වර්ථමානයේ ත්‍රිවිධ හමුදව මුහුණ දෙනු ලබන එල්ටීටීඊ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා මර්ධනය හා අනිකුත් ක්‍රියාන්විතයන් සඳහා අප රෙජිමේන්තුව මගින් ඉතා විශාල මෙහෙවරක් ඉටු කරනු ලබන බවද නොරහසකි.

පසුගිය වකවානුව දෙස ආපසු හැරී බැලීමේදී අප නිලධාරීන් සහ සෙනින් ක්‍රියාන්විත රාජකාරි සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීමේදීත් සංග්‍රාමික කාර්යයන්හි නිරත්වීමේදීත් ඉතා දක්ෂ ලෙස නිර්භීතව දෙණාන්විතව කටයුතු කරමින් ත්‍රස්තවාදීන්ගේ අරමුණු අඩපන කිරීම සඳහා ඉතා විශිෂ්ඨ සේවාවක් ඉටුකර ඇති බව පවසන්නේ හද පිරි සතුටිනි.

හමුදවමය වශයෙන් අප සතුව අතිමහත් කාර්යභාරය වගකීමෙන් හා පරිපූර්ණ ලෙස ඉටු කිරීම සඳහා නායකත්වය, පුහුණුව, ධෛර්යය හා කැපවීම අත්‍යාවශ්‍ය බව ඔබ අප දන්නා කරුණකි. එම පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරි වර්ෂයන් හිදීද ඔබ සැමගේ දයකත්වය ඉතා උසස් අයුරින් ලබා දෙනු ඇතැයි මාගේ අපේක්ෂාවයි.

සංඥ බලකායේ සාමාජිකයින් ශ්‍රී ලංකා ද්වීපයේ සෑම ප්‍රදේශයකම විවිධ දුෂ්කරතා මධ්‍යයේ සිය රාජකාරීන් කටයුතු ඉටුකරනු ලබයි. ඔවුන්ගේ චිත්ත ධෛර්යය උසස්ය, කැපවීම විශිෂ්ඨය, ඒ වෙනුවෙන් මාගේ හෘදයංගම ස්තූතිය මෙම අවස්ථාවේදී පුදකර සිටිමි.

අප මුහුණදී සිටින මෙම ගැටලුවේදී සංඥ බලකායේ නිලධාරීන් හා සාමාජිකයින් විශාල සංඛ්‍යාවක් ඉතා නිර්භීත ලෙස සතුරාට මුහුණදී සටන් කොට සිය අගනා ජීවිතය රටේ ජනතාව වෙනුවෙන් හා භූමියේ අඛණ්ඩතාවය වෙනුවෙන් පරිත්‍යාග කර ඇත. ඔවුන්ගේ සමහරක් අතුරුදහන්ව ඇති අතර, සමහරෙකු පූර්ව හා අර්ධ වශයෙන් ආබාධිත තත්ත්වයට පත්ව ඇත. ඔවුන් සැමට මාගේ ශීර්ෂ ප්‍රණාමය පුදකර සිටින අතර, මියගිය, අතුරුදහන්වූ හා ආබාධිත රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත මාගේ හෘදයාංගම ප්‍රණාමය පුදකර සිටිමි.

වර්ථමානයේ අප මුහුණ පා සිටින යුද්මය වාතාවරණය ඉතා ඉක්මනින් සමථයකට පත්ව මාගේ බලකායේ සේවය කරනු ලබන නිලධාරීන්ටත්, ජ්‍යෙෂ්ඨ කොනොනින් ඇතුලු සෙසුනිලයින්ටත්, ඔවුන්ගේ පවුල්වල සැමටත්, සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සෞභාග්‍යය පිරි අනාගතයක් කඩිනමින් ලගාවේවායි ආශිංසනය කරමි.

ඒඑම්සීඩබ්බී සෙනෙවිරත්න යුඑස්පී පීඑස්සී
මේජර් ජෙනරාල්
බලකාධිපති



# සංඥ බළසේනාධිපති තුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥ බළකාය විසින් පළකරනු ලබන අර්ධ වාර්ෂික සඟරාවේ දෙවන කලාපයට සංඥ බළසේනාධිපති වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ළද භාග්‍යයක් ලෙස සලකමි.

"ද සිග්නලර්" මංගල කලාපය ඉතා උසස් මට්ටමකින් ආරම්භ කරණ ලද අතර, එම උසස් තත්ත්වය රැකගනිමින් දෙවන කලාපය නිකුත් කිරීමට සංස්කාරක මණ්ඩලය ගෙන ඇති පරිශ්‍රමය බෙහෙවින්ම අගය කරමි. මෙම සඟරාව තුලින් සංඥ බලකායේ සියළුම සාමාජිකයින්ගේ විද්‍යුත් තාක්ෂණික දැනුමද තවතවත් වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

පසුගිය වකවානුව තුල ක්‍රියාන්විතයන් සඳහා සංඥ සම්බන්ධතා ලබා දීමේදී බලකායේ සියලුම නිළයන් විසින් ඉතා උසස් අයුරින් ක්‍රියාකර ඇත. සංඥ බළසේනාධිපති ලෙස එම ක්‍රියාවන් ඉතාමත් අගය කරන අතර, ඉදිරියේදීත් ඉතා "ස්ථිර හා ක්ෂණික" ලෙස වඩාත් උසස් මට්ටමකින් සංඥා සම්බන්ධතා ලබාදීමට ඔබ සැමට ධෛර්ය ලැබේවායි මාගේ පැතුමයි. මේ හැකියාව ලබා ගැනීම සඳහා සියලුම නිලයන් හමුද පිලිවෙත අනුව විනයානුකූලව පුහුණුවීම් වලට ලක්කිරීම අප සැමගේ වගකීමයි. එනිසා බලකායේ සියලුම සාමාජිකයන් එකමුතුව ඉදිරියටත් ලබන වසර තුල මහත් කැපවීමකින් තම පුහුණුවීම් කටයුතු වල නිරත වනු ඇතැයි බලාපොරොත්තු වෙමි. ලොව ඇති තාක්ෂණයෙන් ඉතාමත් දියුණු උපකරණය අප සතු වුවත් එය ක්‍රියාකරවන්නන් ගේ අදක්ෂතාවය නිසා නිසි ප්‍රතිපල ලබා ගත නොහැකි තත්ත්වයට පත්වන බව ඔබ සැමොම දන්නා කරුණකි.

අප බලකාය වෙත ඇති සීමිත සම්පත් මගින් අසීමිත කාර්යයන් ඉටු කිරීමට ඇති බව සියලුම නිළයන් ඉත සිතින් ධාරණය කරගත යුතුව ඇත. එම නිසා අප වෙත ලැබී ඇති ඉතා වටිනා උපකරණ ඉතාමත් ආරක්ෂාකාරීව භාවිතා කරමින් අනිසි කටයුතුවල නොයොදවා නිසි පළප්‍රයෝජන ලබා ගනිමින් අප මුහුණපා සිටින බෙදුම්වාදී ත්‍රස්තවාදීන් පරාජය කිරීමට බලකායේ සියලුම නිලයන් අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කරනු ඇතැයි මාගේ විශ්වාසයයි.

තවද තම දේශය වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයෙන් යුතුව තම ජීවිතය පුද කලාවූ බලකායේ සියලුම රණවිරුවන්ට මාගේ ගෞරවනීය ආචාරය පුද කරන අතර, ක්‍රියාන්විතයන්හිදී ආබාධිත වූ සියලුම රණවිරුවන්ට කඩිනමින් ප්‍රකෘති තත්ත්වයට පැමිනේවායි ප්‍රාර්ථනා කරමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥ බලකායේ සියලුම නිලධාරීන් සහ සෙසු නිළයින් හටත් තම පවුල්වල අය ඇතුළු සිවිල් අයවළුන් හටත් සාමයෙන් යුතු සමෘද්ධිමත් අනාගතයක් උදවේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

වයි එස් ඒ ද සිල්වා පීඑස්සී
බ්‍රිගේඩියර්
සංඥ බළසේනාධිපති

# රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් එළිදක්වන "සිග්නලර්" සඟරාවේ දෙවන කලාපය සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවිඩයක් මා නිකුත්කරන්නේ අතිශය ආඩම්බරයෙන් හා මා ලැබූ වරප්‍රසාදයක් ලෙසිනි.

ප්‍රථමයෙන් මෙම සඟරාව සාර්ථකව එළිදක්වන්නට මූලිකත්වය ගෙන දයක වූ සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් වෙත මාගේ ප්‍රණාමය පුදකරමි. ලෝකයේ සීඝ්‍රයෙන් දියුණුවන තාක්‍ෂණය සමග සමාන්තරව ගමන් කිරීම සංඥා බලකායේ සාමාජිකයින් වශයෙන් අප වෙත පැවරී ඇති කාර්‍යභාරය සාර්ථකව ඉටුකිරීම සඳහා ඇති කාලීන අවශ්‍යතාවයකි.

ශ්‍රී ලංකා සංඥ බලකා සංස්ථාව සංඥ රාජකාරීහි නියුක්ත ඒකක තුනක් ද පාබල රාජකාරීන්හි නියුතු ඒකක දෙකක් වශයෙන් පුළුල් වී ඇති අතර, එමගින් සංඥ බලකා සාමාජිකයින් හට තාක්‍ෂණික හා යුද්ද උපක්‍රම ශිල්ප පිළිබඳව මනා අවබෝධයක් හා පලපුරුද්දක් ලබාදීම තුලින් යුද හමුදවේ පොදු අරමුණ ඉටුකිරීම සඳහා දයකවේ.

මෙම සඟරාවේ පලකර ඇති සංග්‍රාමික කටයුතු හා තාක්‍ෂණික කටයුතු පිළිබඳ ලිපි වලින් ශ්‍රී ලංකා සංඥ බලකායේ සහ පොදුවේ ශ්‍රී ලංකා යුද හමුදවේ සියළුම නිලයින්ගේ තාක්‍ෂණික දැනුම හා සංග්‍රාමික දැනුම වර්ධනය කිරීම අරමුණු කෙරේ.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංඥ බලකායේ සාමාජිකයින් වශයෙන් හැකි පමණ ලිපි සැපයීම සියළුම දෙනාගේම වගකීම හා යුතුකමද වේ.

රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙනුවෙන් සංඥ බලකායේ සියළුම නිළධාරීන්ටත්, සෙසු නිළයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සහ සේවා මුක්ත සාමාජිකයින් හා සිවිල් සේවකයින්ටත් මාගේ සුභාශිංසනය පිරිනමමි.

ඊ පී ද ඉසෙඩ් අබේසේකර
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක



# COMMANDING OFFICERS OF SRI LANKA SIGNAL CORPS



ලුතිනන් කර්නල් ආර්වීජ් ඇඹුල්දෙනිය
අණී 1 ශ්‍රීලංසංබ



ලුතිනන් කර්නල්
කේආර්පී රොවෙල් පීඑස්සී
අණී 3 ශ්‍රීලංසංබ



ලුතිනන් කර්නල්
ඒටී බානගොඩ ආර්එස්පී
අණී 4 ශ්‍රීලංසංබ



මේජර් ඒආර් සමරසිංහ
අණී 5 ශ්‍රීලංසංබ



ලුතිනන් කර්නල් ඒජී පෙරේරා යූඑස්පී
අණී 6 ශ්‍රීලංසංබ

# Regtl & Unit RSMs



WO I SMP Pushpakumara
RSM Regtl Centre, SLSC



WO I RP Kotuwegedera
RSM 1 SLSC



WO I WA Chandrasena
RSM 3 SLSC



WO II Daya Ananda WA
RSM 4 SLSC



WO II Ranaweera AEJ
RSM 5 SLSC



WO I WAS Perera
RSM 6 SLSC



ASTRO
DIGITAL SOLUTIONS

The time has come to

Experience the digital difference

of ASTRO

By MOTOROLA

Distributors:

Dynacom ELECTRONICS

451/A Kandy Road
Kelaniya
Sri Lanka
Tel : 910703, 910704, 913552
Fax : 910469, 910797
Email : dynacom@dynanet.lk

*With Best Compliments*

*From*

GE

# GENERAL ENGINEERS & SUPPLIERS COMPANY

TECHNICAL SURVEILLANCE LTD

CARMICHAEL

SAILOR

PAE

RACAL

**Exclusive Agents in Sri Lanka for Racal Cougar Equipment United Kingdom**

40, Sir Mohamed Marcan Markar Mawatha,
P.O.Box 2146,
Galle Face, Colombo 03.
Telephone: 432521/334173/472476/075-334234
Fax: 432521
e-mail: roshanm@sri.lanka.net
Website: www.lanka.net/ges




## සෙ/65951 බනි 11 ගාමිනී ආර්

"ජයසිකුරු" ක්‍රියාන්විතයේ සංඥ සම්බන්ධතාව මනාව ඉටු කරමින් ගුවන් විදුලි ක්‍රියාකරුවෙකු ලෙස ඉතා වටිනා අගනා සේවයක් ඉටු කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරී/සෙසුනිළයින්ගේ පැසසුමට ලක්විය.

1997/06/10 දින 55 වන සේනාංකයේ තාන්ඩිකුලම් කඳවුරට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද බිහිසුනු ප්‍රහාරය පවතින මොහොතේ ගුවන් විදුලි සංඥ සම්බන්ධතාව මනාව ඉටු කරමින්, ක්‍රියාකර එම ප්‍රහාරයෙන් තුවාල වී රුධිරය ගලන මොහොතේදී පවා තම සහෝදර සෙබලුන්ගේ ජීවිත හා යුධ හමුද දේපල බේරා ගැනීමට ඇපකැප වී දක්ෂ ලෙස ක්‍රියා කර ක්‍රියාන්විතය සාර්ථකව නිම කිරීමට දයකවීම තුලින් "රණශූර" පදක්කම සඳහා නිර්දේශ කර ඇත.

මෙම ජේකොනොනි ගේ හැකියාව හා දක්ෂතාවය තුලින් සංඥ සම්බන්ධතාවය මනාව සපයමින්, සාර්ථක ප්‍රතිපල ලබා [illegible]මට දයක විය. එහෙයින් සංඥ රෙජිමේන්තුවේ මෙන්ම මව් ඒකකයේද ගෞරවය ආරක්‍ෂා වන පරිදි ක්‍රියා කල මොහු සංඥ රෙජිමේන්තුවේ දීප්තිමත් අනාගතයකට හිමිකම් කියයි.

දැනට වසර 15 ක පමණ සේවා කාලයක් ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරී කර ඇති මෙම ජේකොනොනි පහත සඳහන් පදක්කම් වලින්ද දැනටමත් පිදුම් ලැබ ඇත.

**වඩමාරච්චි පදක්කම**
**පූර්ණභූමි පදක්කම**
**උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම**
**දීර්ග සේවා පදක්කම**
**රිවිරැස (සන්දරය සමග) පදක්කම**
**50 වසර පදක්කම**

## අණදීම භාරගැනීම - නව ඒකක අණදෙන නිළධාරී



1999.04.04 දින 0845 පැයට නව අණදෙන නිළධාරී උදෙසා සම්මාන මුරයක් පැවැත්වීමෙන් අනතුරුව 1වන සංඥා රෙජිමේන්තුවේ නිළධාරී/සෙසු නිලයින් විසින් සම්මාන පෙලපාලියක් පිරිනමන ලදී. එදින 0930 පැයට පමන චාරිත්‍රානුකුල පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව ආගමික වතාවත් පවත්වා 1014 ට යෙදුන ශුභ මොහොතින් 1වන සංඥ රෙජිමේන්තුවේ අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් ආර්ව්ජ් ඇඹුල්දෙනිය විසින් වැඩ භාර ගන්නා ලදී.

## අණදීමෙන් සමුගැනීම



1 වන සංඥ රෙජිමේන්තුවේ 14 වන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කල ලුතිනන් කර්නල් ආර්ජ් කඩුවෙල අණදීමෙන් සමුගැනීම උදෙසා පැවැත්වුන සම්මාන මුරය පරීක්ෂා කිරීම 1999.04.04. දින මින්නේරියේ දී පවත්වන ලදී.

# 3 වන සංඥා රෙජිමේන්තුවට 10 වසරක් පිරීම

එදා ලක්මවගේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවයට ද්‍රවිඩ ත්‍රස්තවාදීන්ගෙන් එල්ලවෙමින් පැවතුනු තර්ජන හා ක්‍රියාකාරකම් මැඩලීම යුධ හමුදාව සතු කාර්යයක් වු නිසාවෙන් කුඩා භට පිරිස් සංඛ්‍යාවක් සිටි යුධ හමුදාව පුලුල් ලෙස ව්‍යාප්ත කිරීමට සිදුවිය.



3 වන සංඥා රෙජිමේන්තුව
අභිනවයෙන් පිහිටුවීම

මෙයට අනුරූපව සංඥා බලකායද ව්‍යාප්ත කිරීමට සිදු වු අතර එහි ප්‍රථම අදියරය වශයෙන් 1989ක් වු මාර්තු මස 09 වන දින පනාගොඩ දී අභිනවයෙන් 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය නගා සිටුවන ලදී. එවකට පැවතුන වාතාවරණය මත මෙම ඒකකය උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා සංඥා රාජකාරීන් ඉටු කිරීම වස් එවකට 2වන සේනාංක මූලස්ථානය යටතේ එම සේනාංකයට අයත් භූමිභාගයක ස්ථානගත වීමට සිදුවිය. ඒකකය ආරම්භයේදී ඒකක සංස්ථාවට අනුව භට පිරිස් සංඛ්‍යාව, නිළධාරීන් 28ක් සහ සෙනින් 628ක් වුවද, එවකට සෙනින්ගේ හිඟතාවය මත සෙනින් සංඛ්‍යාව 361 පමන විය. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සංඥා රාජකාරී ඉටු කිරීම අප ඒකකයේ ප්‍රධාන වගකීම වු අතර එවකට සිටි අණදෙන නිළධාරී වරුන් ඇතුලු නිළධාරීන්ගේද සෙසුනිලයින්ගේ ද අප්‍රතිහත ධෛර්යය, කැපවීම හා ඒකකයට ඇති ලැදියාව නිසා තම රාජකාරීන් මැනවින් ඉටු කර ඒකකයට නව ජීවයක් ලබාදෙන ලදී. දිනෙන් දින දියුණුවට පත්වුනු ඒකකයේ භට පිරිස් සංඛ්‍යාව, ඉහල යන ලද අතර මේවන විට නිළධාරීන් 53ක ගෙන් හා සෙසුනිලයින් 865 දෙනෙකුගෙන් මෙම ඒකකය පෝෂණය වී ඇත.

මෙම ඒකකය මගින් ඉටුකරනු ලබන සංඥා රාජකාරීන් වලට අමතරව 21වන සේනාංක මූලස්ථානය වෙතින් පැවරෙන පාලනමය රාජකාරීද මනාව ඉටු කිරීමේ හේතුවෙන් එදා මෙදා තුර සේනාංකාධිපතිවරුන්ගේ පැසසුමටද මෙම ඒකකය ලක්වී ඇත.

එවකට 2වන සේනාංක මූලස්ථානය යටතේ පැවති බලසේනා/ඒකක වෙත සංඥා රාජකාරීන් ඉටු කිරීම පමණක් සිදුකලද මේ වන විට මෙම ඒකකය මගින් ක්‍රියාන්විත රාජකාරීන් හි යෙදෙන සේනාංක මූලස්ථාන 4කට සහ ඒ යටතේ වන බලසේනා/ඒකක වලට මෙන්ම ආසේමු (ව) වෙතද සංඥා සම්බන්ධතා රාජකාරී ඉටුකරනු ලබයි.

දස වසරක අනාදිමත් කාලයක් තුල අණදීම කාර්යය ඉටු කරන ලද ඒකක අණදෙන නිළධාරීවරු සංඥා බලකායේ දැනට සිටින ජ්‍යෙෂ්ඨතම නිළධාරීන් බවට පත්ව ඇති අතර එදා මෙදා තුර ඔවුන්ගේ මග පෙන්වීම මෙම ඒකකය දියුණුවෙන් දියුණුවට පත්වීමට හේතුසාධක වී ඇත. ඒකකයට ආවේනික වු රාජකාරීන් වලට අමතරව ක්‍රීඩා අංශයෙන්ද දියුණුව ලබා ඇති මෙම ඒකකයේ ක්‍රීඩකයින් ඔවුන්ගේ සහජ දක්ෂතා අනුව යුද හමුදා තරග කණ්ඩායම් පමනක් නොව ජාතික මට්ටමේ තරග සඳහා ද කණ්ඩායම් නියෝජනය කර ඇත. එමෙන්ම මෙම ඒකක පුහුණු අංශය මගින් ආධුනික සෙනින් පුහුණු කිරීම, සංඥා මූලික පුහුණු පාඨමාලා පැවැත්වීම සහ සේනාංක මූලස්ථානයේ උපදෙස් පරිදි පොලිස් කොස්තාපල් වරුන්, සහායක බලකා සෙනින් සහ කාන්තා



ක්‍රියාන්විත මැදිරියකදී

සෙබලියන් පුහුණු කිරීමේ කටයුතු ද සිදුකරන ලද අතර ඒකක නිල උසස් කිරීමේ පාඨමාලාවන්ද සිදුකරනු ලදී. සංඥා බලකායේ දියුණුවත් සමග යුද වාතාවරනය හේතුවෙන් සංඥා රාජකාරීන් ඉටු කරනු ලබන ඒකක අතරට ආධාරක බලඇණිද එක්වු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 5වන සහ 6වන ශ්‍රීලංසංබ ආධාරක බලඇණි පිහිටුවන ලැබු අතර එම ඒකක සඳහා ද මෙම ඒකකය වෙතින් නිළධාරීන් හා සෙනින් යාකර ඇත.

ක්ෂේත්‍ර හා සංඥා රාජකාරීන් ඉටු



ඒකක-භූමිය එදා දුටු අයුරු

කිරීමේදී ක්‍රියාන්විත ප්‍රදේශ වලින් ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මෙම ඒකක නිළධාරීන් 03ක් හා සෙසුනිලයින් 36ක් ජීවිතක්ෂයට පත්ව ඇත. අප ඔවුන් අදටත් සිහිපත් කරනුයේ ඉමහත් භක්ති ප්‍රණාමයෙනි. එදා සිට අද දක්වා ඉටු කරන ලද ක්‍රියාන්විතයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සඳහා ඉදුරාම සංඥා සම්බන්ධතාවයන් සැපයීම මෙම ඒකකයට භාර වු අතර එම කාර්යයන් මෙම ඒකකය විසින් නොපිරිහෙලා ඉටු කිරීම හේතුවෙන් උසස් මූලස්ථානයන්හි පැසසුමටද ලක්ව ඇත.



3 ශ්‍රීලංසබ ඒකකයට පිවිසීම

මෙම ක්‍රියාකරකම් තුල මෙම ඒකක සෙනීන් දක්වන ලද දක්ෂතා අනුව විශේෂ නිර්දේශ මත රණවික්‍රම, රණශූර හා දේශපුත්‍ර යනාදී පදක්කම් වලින් ද පිදුම් ලැබීමට වරම් ලබා ඇති බැව් සතුටු සිතින් ප්‍රකාශ කල හැක.

මෙම ඒකකය මුලින්ම එවකට 2වන සේනාංකයට අයත් භූමි භාගයක පිහිටි ගොඩනැගිලි කීපයක ස්ථානගත විය. එවකට සිටි අණදෙන නිළධාරීන් මහත් පරිශ්‍රමයක් යොදා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ රජරට සේවයට අයත්, ඔවුන් විසින් පාවිච්චියට නොගත් 21වන සේනාංක මූලස්ථානයට යාබදව පිහිටි භූමිභාගය අප ඒකකය වෙත ලබාගන්නා ලදී.

මේ අනුව එම භූමිභාගය තුල මූලිකව පුහුණු අංශය සහ සංඥා සම්බන්ධතා බලක්ෂණය පිහිටුවන ලදී. දැනට අප ඒකක භූමිය තුල සෙනින්ගේ නවාතැන් පහසුකම් සඳහා දෙමහල් ගොඩනැගිලි 2ක්ද, ඒකක නිළධාරීන් සෙනීන්ගේ ශ්‍රම පරිත්‍යාගයෙන් හා පරිත්‍යාගශීලීන්ගේ ආධාර උපකාර ඇතිව ස්ථිර ගොඩනැගිලි රැසක් ඉදි කර ඇත.

තවද ඒකක ක්‍රීඩා භූමිය සහ ඒකකයට පිවිසෙන නව මාර්ග පද්ධතිය නවීකරනය වෙමින් පවතී. ඒකක සෙනින්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් ඒකකය වෙතින් ණය මුදල් ලබාදීම ඒකක වෙලඳසැලෙන් පහසු මිලට භාණ්ඩ ලබාදීම මෙන්ම සෙනීන්ගේ උත්සව කටයුතු වලදී සහන මිලකට ලබාදීම සඳහා වීඩියෝ සේවාවක්, කැලිප්සෝ සහ අපරදිග සංගීත කණ්ඩායමක් පිහිටුවා ඇත.

එමෙන්ම උතුරු නැගෙනහිර සේවයේ නියුතුව සිට ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියයන ලද මෙම ඒකක සෙනින්ගේ පවුල්වල අයවලුන් හට යුද හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදෙන ලද සහන රැසක් ලබාදීම පිණිස මූලිකව කටයුතු කර ඇත.

මියගිය අයවලුන්ගේ දූ දරුවන් වෙනුවෙන් පරිත්‍යාගශීලීන්ගේ ආධාර උපකාර ඇතිව දැනටමත් ශිෂ්‍යත්ව කීපයක් ලබා දී තිබීම සුවිශේෂ කරුණකි.

මෙම ඒකකයේ 10වන සංවත්සරය 1999.03.09 වන දින සමරණ ලද අතර එය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් විවිධ වැඩ සටහන් මාලාවක් ඉතාමත් අලංකාරව පවත්වන ලදී.

ඒ අතර, ප්‍රථම කොට මියගිය රණවිරුවන් හට පිංපැමිණවීම්, ඒකක



බනි සැරයන් භෝජනාගාරය ඉදිවෙමින් තිබු අයුරු

පවුල් දිනටය පැවැත්වීම හා අණදෙන නිළධාරී වෙත සම්මාන පෙලපාලියක් පැවැත්වීම විශේෂ තැනක් හිමි කර ගන්නා ලදී.



මියගිය රණවිරුවන්ට සෙත්පතා බෝධිපූජා පැවැත්වීම



ඒකක දින බනි/සැරයන් නිවස්නයේදී

දස වසරක කාලයක සිට දියුණුවේ මන්පෙත් ඔස්සේ ගමන් කරන 3වන සංඥා රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද හමුදාවටත් පොදුවේ මුලු මහත් රටටත් ජාතියටත් ගෞරවණීය සේවයක් ඉටු කිරීම ආඩම්බරයට කරුණකි.

# " IDENTIFYING YOUR GOALS FOR THE FUTURE "

*" Year by year, becoming better equipped to accomplish the things we are striving for. But what are we striving for ??? "*

## AIMLESS DRIFTERS OF PRESENT TIMES

Two thousand ago the Roman philosopher Lucius Annaeus Seneca commented that,

"For a ship without a harbour No wind ever blows from the right quarters'

Yet despite the importance of setting goals, the vast majority of people spend their lives aboard Senec's aimlessly drifting vessel. They are constantly blown to and fro by the vicissitudes of fate, without any clear course to steer and with no particular destination in mind.

Instead of being and to work consistently and efficiently toward clearly defined objective, the individual becomes a victim of chance and circumstance.

How many people fail to set goals? As per research made, it could be as high as 97 percent of the population ! One study found that some 30 per cent of the population are inactive: they have no goals and act only when told what, where and how to do it by another person.

Around 50 percent are reactive: responding to events instead of trying to initiate change or control their destiny. They spend their lives labouring to achieve the goals of others.

A further 10 per cent dreamers full of fantastic schemes to gain fame and fortune. Unfortunately, their goals are so imprecise and unrealistic they can never take the practicle steps needed to make them a reality.

FOUR TYPES OF PEOPLE




This leaves just 10 per cent of the population who are proctive. Instead of waiting to be told what to do, or responding to events dictated, by others, or dreaming their lives away, they go out the word and make things happen.

Instead of being content to pay the hand life deals, they deal them - selves a better hand. They initiate change and actively take control of their lives. They look on change not as a threat but as an opportunity.

Yet even among this selected group, good remains haphazard and infrequent. In a study made in the Yale university in 1953, it was found that 3 per cent ever set themselves goals in life.

But the researchers also reported that among this tiny proportion were found the most successful men and women in every field of human endeavour. They included top business and sporting personalities, stunningly successful entrepreneurs and highly respected academics, military strategists, word- class journalists, writers and artists, prize - wining scientists and top of the bill entertainers. This 3 per cent had out - performed and out - earned the rest of their class mates, often by a factor of hundreds of times.


**T F MEEDIN RSP**
Lt Col.




# A BREIF OVERVIEW OF GSM

## HISTORY OF GSM

1. 1980 දශකය ආරම්භයේදී "ANALOG CELLULAR" දුරකථන පද්ධතියන්හි සීඝ්‍ර වර්ධනයක් යුරෝපා මහද්වීපය තුල දක්නට ලැබුනි. විශේෂයෙන්ම එංගලන්තය, ප්‍රංශය හා ජර්මනිය වැනි රටවල එම රාජ්‍යන්ට වෙන්වුන් එකිනෙකට වෙනස්වුන් "CELLULAR" දුරකථන පද්ධති ව්‍යාප්ත වී තිබුණි. යුරෝපා මහද්වීපයට අයත් බොහොමයක් රටවල දේශ සීමා වශයෙන් භූමියෙන් (LAND LOCKED COUNTRIES) වටවී ඇති අතර එම රටවල වැසියන් නිතර අසල රටවලට විවිධ අවශ්‍යතාවන් (රැකියා, ආර්ථික හා සංචාර) සඳහා ගමන් කරන බැවින් ඔවුන් භාවිතා කරන "ANALOG CELLULAR" දුරකථන අනෙකුත් රටවලට පැමිණීමෙන් පසු භාවිතා කිරීමට නොහැකි වු බැවින් එම දුරකථනයන්හි ඇති ප්‍රයෝජනය උපරිම නොවීය. එම හේතුව නිසා "CELLULAR" දුරකථන නිෂ්පාදනය කරන්නන් හා අලෙවි කරන්නන් බලාපොරොත්තු වු තරමේ ආර්ථික වාසියක් අත් නොවීය.

2. 1982 වන විට යුරෝපීය ජාතිකයන් මුළු යුරෝපය පුරාම ගෙනයා හැකි ජංගම දුරකථනයක් පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා CEPT ආයතනය (CONFERANCE EUROPEAN POSTS AND TELEGRAPH) මගින් විශේෂ ඉංජිනේරු කණ්ඩායමක් නමින් පත්කර, ජාත්‍යන්තර වශයෙන් භාවිතා කල හැකි ජංගම දුරකථන පද්ධතියකට අඩිතාලම යොදන ලෙස උපදෙස් දෙන ලදී. 1989 වන විට GSM කණ්ඩායමේ වගකීම ETSI ආයතනය (EUROPEAN TELECOMMUNICATION STANDARDS INSTITUTE) වෙත පැවරීමෙන් පසු පලමු අදියරේ පිරිවිතරයක් 1990 වන විට ඉදිරිපත් කරන ලදී. වසර මැද භාගය වන විට ඊට අදල GSM ජංගම දුරකථන පද්ධති නිෂ්පාදනය කල අතර 1993 වන විට GSM දුරකථන පද්ධති 36ක් රටවල් 22ක් තුල ක්‍රියාත්මක වු අතර තවත් රටවල් 25ක් ඒ සඳහා සුදනම් වෙමින් පැවතුනි. 1994 වසර ආරම්භය වන විට ලෝකය පුරා මිලියන 1.3ක් GSM දුරකථන භාවිතා කරන්නන් සිටි අතර GSM යන අකුරු තුනෙන් ඉදිරිපත් වු "GROUP SPECIAL MOBILE" යන අර්ථය එම අකුරු තුනට වඩාත් උචිත ලෙස "GLOBAL SYSTEM FOR MOBILE COMMUNICATION" යනුවෙන් වෙනස් විය. මේ වන විට භාවිතා වු AMPS (ADVANCED MOBILE PHONE SYSTEM) සහ TACS (TACTICAL ACCESS COMMUNICATION SYSTEM) ලෙස භාවිතා වු "ANALOG CELLULAR" දුරකථන පද්ධතියට GSM දුරකථන සතු "COMPRESSION ALGORITHMS" සහ "DIGITAL SIGNAL PROCESSORS" යන ගුනාංග මගින් සතුවු ස්වභාවය (QUALITY) හා අගය (COST) සමගින් තරග කිරීමට සිදුවිය.

## ARCHITECTURE OF THE GSM NETWORK

3. GSM පද්ධතියක් ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් (රූපය 1) සමන්විතයි.

අ. ජංගම දුරකථන (MS - MOBILE STATION)




රූපය - 1

ජංගම දුරකථනය සමන්විත වන්නේ "TRANSCEIVER", "DISPLAY", "DIGITAL SIGNAL PROCESSORS" සහ SIM (SUBSCRIBER IDENTITY MODULE) ලෙස හඳුන්වන "SMART CARD" යන උපකරණ වලිනි. SIM උපකරණය මගින් දුරකථනය භාවිතා කරන්නාට ජංගම දුරකථනයක නියම අරුත ලබාදෙමින් එය භාවිතා කරන ස්ථානය හඳුනාගෙන අවශ්‍ය දුරකථන ඇමතුම් ලබාගැනීමේ හැකියාව ඇති කරයි. GSM CELLULAR දුරකථනයක් භාවිතා කරන අයෙකුට තමාගේ දුරකථනයේ ඇති SIM උපකරණය වෙනත් GSM CELLUAR දුරකථනයකට සම්බන්ධ කිරීමෙන් තමාගේ GSM දුරකථනයේ තිබු සියළුම පහසුකම් ලබා ගත හැක. GSM පද්ධතිය සතු IMEI (INTERNATIONAL MOBILE EQUIPMENT IDENTITY) ක්‍රමය හා SIM උපකරණය සතු IMSI (INTERNATIONAL MOBILE SUBSCRIBER INDENTITY) ක්‍රමය සමග ඇති රහස්‍ය හඳුනාගැනීමේ (AUTHENTICATION) හැකියාව නිසා ජාත්‍යන්තර වශයෙන්ද මෙම GSM දුරකථන භාවිතා කල හැක. තවද පුද්ගලික හඳුනාගැනීමේ අංකයන් ලබාදීමෙන් මෙම SIM උපකරණය අවසර නොලත් අයෙකු භාවිතා කිරීමද වැලක්විය හැක.

ආ. මූල ස්ථාන උපපද්ධතිය (BSS-BASE STATION SUBSYSTEM)

ඔබගේ GSM CELLULAR දුරකථනය ඇමතුම් ලැබෙන්නේත් ලබාගන්නේත් මෙම BSS උපකරණ පද්ධතිය මගිනි. එය ප්‍රධාන වශයෙන් BTS (BASE TRANCEIVER STATION) සහ BSC (BASE STATION CONTROLLER) ලෙස කොටස් දෙකකි.

### I. BTS

මේ සඳහා රේඩියෝ (TRANSCEIVER) කිහිපයක් එක් එක් ස්ථානයන්/කෝෂ (CELL) සඳහා අයත් විය හැකි අතර ජංගම දුරකථන හා මෙම රේඩියෝ අතර සම්බන්ධතාවය (RADIO-LINK PROTOCOLS) BTS මගින් පාලනය කරනු ලබයි. විශාල ප්‍රදේශයක දුරකථන පහසුකම් සැපයීම සඳහා BTS කිහිපයක්ම එම ප්‍රදේශය පුරාම ස්ථාපිත කල හැක.

### II. BSC

BTS එකක් හෝ කිහිපයක් පාලනය කරනු ලබන්නේ BSC මගිනි. ඒ අනුව රේඩියෝ චැනල ලබාදීම, සංඛ්‍යාත මාරුව ඇතුළු කාර්යයන් කිහිපයක්ම BSC මගින් රේඩියෝ උපකරණයක භාවිතා වන අතර 13kbps වේගයක් සහිත චැනලයක් 64 kbps ක වේගයක් සහිත චැනලයක් ලෙස පරිවර්තනය කර PSTN (PUBLIC SWITCHED TELEPHONE NETWORK) හෝ ISDN (INTEGRATED SWITCHING DIGITAL NETWORK) සමග සම්බන්ධවීමට හැකියාව ලබාදෙයි. BSC එකක් මගින් BTS කිහිපයක් පාලනය කරන්නා සේම එය MSC (MOBILE SERVICE SWITCHING CENTER) මධ්‍යස්ථානය හා සම්බන්ධ වී ඇත.

ඇ. ජාලා උපපද්ධතිය (NET WORK SUB SYSTEM)

ජාලා උප පද්ධතියට අදල ප්‍රධාන අංශයක් වන්නේ MSC මධ්‍යස්ථානයයි. MSC මධ්‍යස්ථානය මගින් PSTN හා ISDN ජාලයන් GSM ජාලය වෙත සම්බන්ධ කිරීම සිදුකරන අතර ජංගම දුරකථන දායකයෙකුට අදල ලියාපදිංචි කිරීම (REGISTRATION) වලංගු බව සනාථ කර ගැනීම. (LOCATION UPDATING) පිහිටීම අළුත් කිරීම, පවරා දීම (HAND OVER) හා ඇමතුම් හැසිරවීම (CALL ROUTING) යන කාර්යයන් සඳහා HLR (HOME LOCATION REGISTER), VLR (VISITOR LOCATION REGISTOR) සහ EIR (EQUIPMENT INDENTITY REGISTOR) යන ලැයිස්තුව සමගින් දායකවෙයි.


**විඑල් ප්‍රේමසිරි**
මේජර්
රේඩියෝ රිලේ අංශය - සංඥ මූලික වැඩපල

# "BRAVE SIGNALERS WHO SACRIFICED THEIR LIVES TO SAVE ANOTHER"



## KIA - 5 SLSC (RFT)

| SRL NO | REGTL NO | RANK | NAME | | DATE | PLACE |
|---|---|---|---|---|---|---|
| 1 | S/275760 | SGT | SAMAN KUMARA | URD | 99.04.06 | VALACHCHENAI |
| 2 | S/275823 | SGT | RANJITH PRIYANTHA | MHR | 98.12.31 | KIRAN |
| 3 | S/275970 | CPL | JAYARATHNA | PGA | 96.12.31 | KIRAN |
| 4 | S/275927 | CPL | NOYEL JIWAKUMARA | GI | 99.03.11 | VALACHCHENAI |
| 5 | S/275784 | CPL | CHAMIL ROHANA | MK | 99.04.06 | VALACHCHENAI |
| 6 | S/276111 | L/CPL | THENNAKOON | MK | 98.12.31 | KIRAN |
| 7 | S/277225 | L/CPL | SAMARATUNGE | JSN | 98.12.31 | KIRAN |
| 8 | S/277449 | L/CPL | RATHNAYAKE | RSMJ | 98.12.31 | KIRAN |

## KIA - 6 SLSC (RFT)

| SRL NO | REGTL NO | RANK | NAME | | DATE | PLACE |
|---|---|---|---|---|---|---|
| 9 | S/42978 | L/CPL | THILAKARATHNE | HM | 99.04.06 | VALACHCHENAI |

**ශ්‍රී ලංසංබට අයත් ඒකකයන් හි ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියගිය ප්‍රථම සාමාජිකයා**



| | | |
|---|---|---|
| අංකය | : | සෙ/00141 |
| නිලය | : | ලා/කෝප්ල් |
| නම | : | රංජිත් විජේසිංහ ඩී.කේ. |
| ඒකකය | : | 2 ශ්‍රීලංසංබ (ස්වේච්ඡා) |
| මියගිය දිනය | : | 1988.01.30 දින |
| ස්ථානය හා සිද්ධිය | : | ත්‍රිකුණාමලය තිරියාය ප්‍රදේශයේ සංඥා රාජකාරී කරමින් සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියයන ලදී. |

# "SHED BLOOD FOR A WORTHY CAUSE AND LIVED TO SERVE ANOTHER DAY"

## WIA - 1 SLSC

| SRL NO | REGTL NO | RANK | NAME | | DATE | INCIDENT | TYPE OF INJURY |
|---|---|---|---|---|---|---|---|
| 1 | O/62069 | Capt | SKAA WIJESINGHE | | 1998.12.11 | Terr gun shot at MNR | Injury to left leg |
| 2 | S/276276 | Sgt | JAYATHILAKA | SMSK | 1998.12.07 | Motar Bomb blast at Oddusudan | Amputated R/L fingers |
| 3 | S/277065 | Sgt | SAMARAWEERA | MJ | 1999.04.06 | Terr gun shot at VLN | |

## WIA - 3 SLSC

| SRL NO | REGTL NO | RANK | NAME | | DATE | INCIDENT | TYPE OF INJURY |
|---|---|---|---|---|---|---|---|
| 4 | S/275390 | L/Cpl | Hemasiri | SR | 1998.12.06 | Motar blast at Oddusudan | Injury to right leg & L/hand |

## WIA - 5 SLSC (RFT)

| SRL NO | REGTL NO | RANK | NAME | | DATE | INCIDENT | TYPE OF INJURY |
|---|---|---|---|---|---|---|---|
| 5 | S/275830 | Sgm | Karunaratne | P | 1998.10.19 | Terr gun shoot at Kinniadi | Injury to both Leg |
| 6 | S/276148 | Sgm | Sumathipala | L | 1998.11.12 | Bomb blast at VLN | Amputated both hands |
| 7 | S/275954 | Sgm | Dharmasena | RSC | 1999/04/05 | Terr gun shot at VLN | |
| 8 | S/276192 | Sgm | Sisira Kumara | KGM | 1999/04/06 | Terr gun shot at VLN | |
| 9 | S/276184 | Sgm | Rosan de Silva | MADS | 1999/04/06 | Terr gun shot at VLN | |
| 10 | S/277143 | Sgm | Ranjith | SM | 1999/04/06 | Terr gun shot at VLN | |
| 11 | S/276634 | Sgm | Vasala Bandara | IK | 1999/04/06 | Terr gun shot at VLN | |

## WIA - 6 SLSC (RFT)

| SRL NO | REGIL NO | RANK | NAME | | DATE | INCIDENT | TYPE OF INJURY |
|---|---|---|---|---|---|---|---|
| 12 | S/277866 | Sgm | Nishantha | GM | 1999.01.16 | Gun Shot | Injury to right leg |
| 13 | S/302254 | Sgm | Edissooriya | MD | 1999.04.06 | Terr gun shot at VNA | Injury to hand |



# Army Order No. 11/51 Raising Instrs of "A" Tp, 1 Sqn CSC on 12 Feb 1951

RESTRICTED
ARMY ORDERS
BY
BRIGADIER THE EARL OF CAITHNESS, CBE. DSQ
ARMY COMMANDER
NO. 11 - 15

HEAD QUARTERS CEYLON ARMY
NO.
DATE 12.2.51
PAY & RECORDS

Colombo, 12 Feb 1951,

A.O.No.11/51 CA/G/7.

ESTABLISHMENTS

1. The following estbs have been approved:-

| Estb No. & Date | | | Unit | To be Effective by | Review Date |
|---|---|---|---|---|---|
| HQ/1/1/51 | of | 12 Jan 51 | Army HQ. | 30 Sep 51 | 31 Jul 51 |
| SIGS/1/1/51 | " | 13 jan 51 | 'A' Tp 1 Sqn CSC. | 30 Sep 51 | 30 Jun 51 |
| HQ/3/1/51 | " | 19 Jan 51 | Sta Staff DLA. | 30 Sep 51 | 1 Jun 51 |
| VOLUNTEER FORCE - PERMANENT STAFF | | | | | |
| ARTY/1/1/51 | of | 19 Jan 51 | 2(V) CA/AA Regt CA | 30 Sep 51 | 1 Jun 51 |
| ENGRS/3/1/51 | " | 15 Jan 51 | 2 (V) Fd Sqn C.E. | 30 Sep 51 | 1 Jun 51 |
| SIGS2/1/51 | " | 15 Jan 51 | 2 (V) Sqn CSC. | 30 Sep 51 | 1 Jun 51 |
| INF 3/1/51 | " | 15 Jan 51 | 2 (V) Bn CLI. | 30 Sep 51 | 1 Jun 51 |
| ST/2/1/51 | " | 15 Jan 51 | 2 (V) Coy CASC | 30 Sep 51 | 1 Jun 51 |
| MED 3/1/51 | " | 15 Jan 51 | CAMC (V). | 30 Sep 51 | 1 Jun 51 |
| INF/4/1/51 | " | 19 Jan 51 | C.C.C. | 30 Sep 51 | 1 Jun 51 |

SIGS REGS.
PART I SIGS MSGES.
A. SIG TIME.

1. All services will use the Radio Ceylon Time Sig for synchronization. This is radiated by Radio Ceylon at frequent intervals during the day. The exact time is indicated by the last "Pip" or chime.

Time Zone Suffix System.

2. The Zone suffix system is designed to prevent misunderstanding or doubt as to the mesuring of time quoted in comns.

Instrs for using the System in Msges.

3. (a) Originators of msges will invariably complete the "Date - Time of Origin" (DTO) space on the msge form, or in cases where the msg form is NOT available, will add the date - time or origin immediately after the address "from".

(b) The DTO will be followed by a suffix letter or letters appropriate to the time used, in accordance with the following table.

| No of hrs that time in question is ahead of G.M.T. | Appropriate Suffix. | No of hrs that time in question is behind G.M.T. | Appropriate Suffix. |
|---|---|---|---|
| 1 | A | 1 | N |
| 2 | B | 2 | O |
| 3 | C | 3 | P |
| 4 | D | 4 | Q |
| 5 | E | 5 | R |
| 6 | F | 6 | S |
| 7 | G | 7 | T |
| 8 | H | 8 | U |
| 9 | I | 9 | V |
| 10 | J | 10 | W |
| 11 | K | 11 | X |
| 12 | L | 12 | Y |
| | M | | |

(C) GMT is indicated by the suffix Z.







With Compliments from




278, Union Place, Colombo 2. Tel: 302302, Fax: 302333.

*Simply Different*




- At an investiture parade in Colombo, an Officer who was more or less in a peace area received a medal. A group of Young Officers seated at the back had their own opinion "that was for being brave enough to indulge in what ever, without protection against AIDs".

- A Captain helping out a Lieutenant prepare for his Special to Arm exam had been over heard by the CO from his rest room.

Lt. : Please define good communications Sir.

Capt. : It is like having a good cup of coffee at night.

Lt : Why is that Sir,?

Capt. : It feels good to have it at night. It also makes you forego sleep as a result.

Lt : What do you understand by brevity in a message?

Capt. : It is like a short ladies skirt.

Lt : How can it be that Sir?

Capt : It is because the skirt has to be short enough to be interesting and long enough to cover the subject.

- A Signals Sergeant serving in Jaffna during good old days was ordered by his OC to report to Panagoda by the night mail, the following day. The Sergeant arriving at the station was persuaded by an young attractive girl to stand down and offer her the berth, as the train was full up. The Sergeant knowing that he could not make the dead line given by his OC sent him a telegram which read as follows;



"Gave berth to girl, will come next train"

The OC on receiving this, replied the Sergeant immediately by a return telegram. "Congratulations Sergeant, your next confinement will be in barracks".

- The Station Officers' Mess harbours many Officers from almost all the regiments. It was surprising to note that the toilets remained a place to store information in an era where it is kept in safe places like Archives and that too in CDs.



Just note this for reference.

"If a bit of shit could entice wit, what about tasting a bit."

"Don't be doubt full, take a mouth full."

"You chaps are chaps of wit but shine where others shit."

- Mr. Day was produced in court for kissing a girl on her arm.

Judge : "Are you Mr. Day?"

Day : "So the people say."

Judge : "Did you kiss the girl on her arm?"

Day : "Kissing a girl on the arm,
I thought was no harm."

Judge : "I don't want your rhyme."

Day : "Me Lord,
they just come in time."

Judge : "Get out of my sight."

Day : "Thank you my Lord,
Your judgement is right."

A R Samarasinghe
Major
CO 5 SLSC









# ක්‍රීඩා විසිතුරු



Inter Regt Rugger Championship - 1999
Runners Up Team

## 3 ශ්‍රීලංසංබ 10 වන සංවත්සරය නිමිත්තෙන් පැවති අන්තර් රෙජිමේන්තු තරඟාවලිය

ශ්‍රීලංකා සංඥ බලකායේ 3 වන සංඥ රෙජිමේන්තුව සිය 10 වන සංවත්සරය සැමරීම නිමිත්තෙන් සංවිධානය කෙරුනු අන්තර් සංඥ රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය 99.03.03 හා 04 යන දිනයන්හිදී 3 ශ්‍රීලංසංබ වොලිබෝල් ක්‍රීඩා පිටියේදී උත්කර්ශවත් අන්දමින් පවත්වන්නට යෙදිනි. ඒ සඳහා 1වන, 4වන හා 5වන සංඥ රෙජිමේන්තු මගින් එක් වොලිබෝල් තරඟ කණ්ඩායමක් බැගින් සහභාගි කරවු අතර, 3වන සංඥ රෙජිමේන්තුව මගින් ඒ සහ බී වශයෙන් තරඟ කණ්ඩායම් දෙකක් ඉදිරිපත් කර තිබුනි. තරඟ කණ්ඩායම් 5 කොටස් දෙකකට බෙදා කුසපත් ඇදීමෙන් තරඟය පැවැත්විය. මෙම තරඟාවලියේ අවසාන වටය සඳහා 3 ශ්‍රීලංසංබ ඒ කණ්ඩායම සහ 5 ශ්‍රීලංසංබ තරඟ කණ්ඩායම තරඟයට පිවිසි අතර තරඟ වට 3/5 ක් විශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කරමින් 5 ශ්‍රීලංසංබ තරඟ කණ්ඩායම විජයග්‍රාහී අත්පන්දු කණ්ඩායම සඳහා වන ශූරතා කුසලානය දිනාගන්නා ලදී. මෙම තරඟාවලියේ අනුශූරතාවය 3 ශ්‍රීලංසංබ ඒ කණ්ඩායමට හිමිවු අතර තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය 3 ශ්‍රීලංසංබ ඒ කන්ඩායමේ සෙ/66652 කෝප්‍රල් සේනානායක එස්එම්ජේකේ විසින් දිනාගන්නා ලදී.

**ලූතිනන් අනුරාධ මෙන්ඩිස් විසිනි.**



1999.04.10 වන දින ජාතික තරුණ සේවා සභාව මහරගම හිදී පැවති "ෆිට්නස් කින්ඩම්" විවෘත අයෝමය පුරුෂයා තේරුම් තරගාවලියේදී සෙ/276 476 ලා/කෝ වීරතුංග ඩීඑන් ක්‍රීඩා ඇමති එස්බී දිසානායක මැතිතුමා අතින් ජය සංකේත ලබන මොහොත.




2nd place in Standard 125 CC event conducted at Fox Hill Super Cross by SLMA.

# ක්‍රීඩා විසිතුරු



## සෙ/6 6 072 සැරයන් හෙට්ටිආරච්චි ඒ

- 1985 වර්ෂයේ සිට 1996 දක්වා ශ්‍රී ලංකා යුධ හමුද හොකී කණ්ඩායම නියෝජනය කරමින් ආරක්ෂක සේවා පිලට ක්‍රීඩා කරන ලදී.
- 1993 වර්ෂයේ ශ්‍රී ලංකා යුධ හමුද හොකී "බී" කණ්ඩායමේ නායකත්වය දරණ ලදී.
- 1994 වර්ෂයේ යුධ හමුද හොකී "ඒ" කණ්ඩායමේ නායකත්වය දරණ ලදී.
- 1996 වර්ෂයේ ආරක්ෂක සේවා හොකී කණ්ඩායම සමග (ඉන්දියා - බංගලාදේශ) සංචාරය සඳහා සහභාගි වන ලදී.
- 1994 වර්ෂයේ ශ්‍රී ලංකා යුධ හමුද හොකී කණ්ඩායමේ නායකත්වය දරණ කාල සීමාව තුල (මුවර්ස් කප්) කුසලානය දිනා ගන්නා ලදී.



## දිරිය වඩන පුතුන්

සෙ/276479 ලාන්ස් කෝප්‍රල් නිලන්ත ඩබ්.එල්.පී. මන කොනොනි 1993.07.06 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවට බැදී ආධුණික පුහුණු පාඨමාලාව හා මූලික සංඥා පුහුණු පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව විදුලි පණිවුඩ ක්‍රියාකරුවෙකු වශයෙන් 4 වන ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත ඇතුළත් කරන ලද ආත්මාරක්ෂක සටන් කලාව ප්‍රගුණ කල දක්ෂ ක්‍රීඩකයෙකි.

1972.11.26 වන දින ගාල්ල අක්මීමණ ප්‍රදේශයේ උපත ලද ප්‍රසාද් නිලන්ත නැමති මොහු පාසැල් යන අවධියේ සිටම සටන් කලාව කෙරෙහි මහත් ඇල්මක් දක්වන ලද අයෙකි. මූලික අධ්‍යාපනය මානවිල පර්ෂද මූලස්ථානයෙන් ලබා ඇති අතර, වැඩිදුර අධ්‍යාපනය සඳහා ගාල්ල ඇලෝසියස් විදුහලට ඇතුලත් වන ලදි, තම අධ්‍යාපනය ලබන අතරම සටන් කලාවද, 1986 සිටම හදාරා අනතුරුව 1989 සිට කුංෆු සටන් කලාව හදාරා ඇත.

කුංෆු සටන් කලාව හැදෑරීම ආරම්භ කර ඒ පිළිබඳව මනා දක්ෂතාවයක් ලබා සිටි මොහු ශ්‍රී ලංකා යුධ හමුදාවට බැඳීමෙන් පසුවද හමුදා රාජකාරීන් ද මනාව ඉටු කරමින් තමා වෙත ලැබෙන විවේක කාලයන්හි තම සටන් කලාව ප්‍රගුන කිරීමෙහි ලා යොදවමින් ඉතා උනන්දුවෙන් හා කැපවීමකින් යුතුව පුහුණුවීම් කටයුතුවල නියැලුන මොහු මේ වනවිට පහත සඳහන් ශූරතාවයන් හිමි කරගෙන ඇත.

- 1991 වසරේ ගාල්ල දිස්ත්‍රික්කයේ වසර 02 වුෂු සහ ටයිග යන අංශයන්හි ප්‍රථම ස්ථානය.
- 1995 බදුල්ල වුෂු තරඟාවලියේදී දිග පොල්ල, ඩ්‍රන්කන්, හා ස්නෙක් යන අංශ තුනෙන්ම ප්‍රථම ස්ථානය.
- 1998 ගාල්ල වුෂු තරඟාවලියේදී ටයිග, නැංචු ඇන් සහ තායිජී යන අංශ තුනෙන්ම ප්‍රථම ස්ථානය.
- 1999 ඇඹිලිපිටියේදී පවත්වන ලද විවෘත වුෂු තරඟාවලියෙන් දෙවන ස්ථානය.

මීට අමතරව බ්ලැක් ඩ්‍රැගන් (චයිනීස් මාෂල් ආර්ට්) සංගමයේ සටන් උපදේශකයෙකු වශයෙන් ක්‍රියා කරනු ලබන අතර, 1999 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත සමස්ථ ලංකා වුෂු ශූරතා තේරීමේ තරඟාවලියට සහභාගි වීම සඳහා පුහුණුව ලබමින් සිටී. මොහු ඒකකයට මහත් ගෞරවයක් ලබාදිය හැකි කුංෆු සටන් කලාවේ දීප්තිමත් අනාගතයක් ඇති විනය ගරුක සෙබලෙකි.

දිරිය වඩන වීර පුතෙකු වන මොහුගේ හැකියාවන් එලි දැක්වීම සඳහාත්, ඔහුගේ යටපත් වී තිබෙන දක්ෂතාවයන් වර්ධනය කරගැනීම සඳහාත් ඉදිරි අනාගතයේ අවස්ථාව උදාවේවායි අපි ප්‍රාර්ථනා කරමු.

**සෙ/275187 කෝප්‍රල් ගුණසේකර එන්ජීජ්**
4 ශ්‍රීලංසංබ.





ලුතිනන් බීඑම් ජයවීර හා ඔහුගේ මනාලිය දිලිනිද සිල්වා මෙනවිය



විවාහ වූ දිනය -
1998.11.30

පෝරුව චාරිත්‍ර සිදුකරනු ලැබූ වේලාව
10.39

ස්ථානය -
මවුන්ට් ලැවීනියා හෝටලය



කපිතන් ජඑම්ඩබ්ඩබ්කේ ඒකනායක හා ඔහුගේ මනාලිය සුභාෂිනී අබේනායක මෙනවිය

විවාහ වූ දිනය -
1999.01.22

ස්ථානය -
මහවැලි රීච් හෝටලය - කටුගස්තොට







කෝප්‍රල් අතුල කුමාර කේජ් හා ඔහුගේ මනාලිය යු අනුලා ප්‍රියදර්ශනී මෙනවිය

විවාහ වූ දිනය -
1997.01.23

පෝරුවේ චාරිත්‍ර -
10.24

ස්ථානය -
මනාලියගේ නිවසේදී





SLSC Regtl Brass Band

4 SLSC- Beat Group

3 SLSC- Calypso Band

1SLSC- Beat Group

Riggers In Action
"Sky is the limit"